# දරුවන් උදෙසා
# බයිබලයක්

# ජේසුස් වහන්සේ සහ ලාසරුස්




**ඉදිරිපත් කරන්නා**: Edward Hughes

**නිදර්ශනය කරන්නා**: Janie Forest
Alastair Paterson

**සකස්කරන්නා**: Ruth Klassen

**පරිවර්ථනය කරන්නා**



**නිෂ්පාදනය කරන්නා**: Bible for Children
www.M1914.org



©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.




මරියා සහ මාර්තා කනස්සල්ලට පත් වූවෝය. ඔවුන්ගේ සහෝදර ලාසරුස් ඉතා අසනීපව සිටියේය. ලාසරුස් ඉක්මනින් මිය යන බව සහෝදරියන් දැන සිටියෝය. ඔවුහු ජේසුස් වහන්සේව ගෙන්වා ගන්නට මිනිසුන් යැව්වෝය. උන්වහන්සේ බෙතානියේ මේ කුඩා පවුලට ආදරය කළ සේක.




ජේසුස් වහන්සේ ලාසරුස් ගැන ඇසූ විට, “මේ අසනීපය මරණයෙන් අවසන් නොවේ” කියා තම ගෝලයන්ට කීසේක. ජේසුස් වහන්සේ සිටියේ සැතපුම් ගණනාවක් ඈතින් වුවත්, ලාසරුස්ට සිදු වීමට නියමිත දේ උන්වහන්සේ හොඳින් දැන සිටිසේක.
3


ජේසුස් වහන්සේ බෙතානිය බලා පිටත් වීමට දින දෙකක් ප්‍රමාද වූසේක. ඉන්පසු උන්වහන්සේ තම ශ්‍රාවකයන්ට ප්‍රහේලිකාවක් වූ යමක් කීසේක. “ලාසරුස් මැරිලාය. මම එතන හිටියේ නැති එක ගැන සතුටු වෙමි. දැන් නුඹලා විශ්වාස කරනු ඇත.” මෙම අමුතු වචන වලින් අදහස් කළේ කුමක්ද? ජෙසුස් වහන්සේ සැලසුම් කළේ කුමක්ද?
4


ජේසුස් වහන්සේ බෙතානියට පැමිණෙන විට ලාසරුස් මියගොස් දින හතරකි. සොහොන් වස්ත්‍රවලින් ඔතා තිබූ ඔහුගේ සිරුර තබා
තිබුණේ ගුහාවක් වැනි සොහොනකය.
5


මාර්තා ජේසුස් වහන්සේ හමුවීමට ගියාය. “ඔබේ සහෝදරයා නැවත නැඟිටින්නේය” කියා ජේසුස් වහන්සේ කීසේක. “මම දනිමි - ඒ අන්තිම දවසේ නැවත නැඟිටීමේදී” යි මාර්තා පිළිතුරු දුන්නාය. ලාසරුස්ව නැවත දැකීමට කාලය අවසන් වන අන්තිම දවස දක්වා බලා සිටිය යුතු බව ඇය සිතුවාය. නමුත් ජේසුස් වහන්සේ
අදහස් කළේ වෙනස් දෙයකි.
6


“මම නැවත නැඟිටීම සහ ජීවනය වෙමි”
යි ජේසුස් වහන්සේ මාර්තාට කීසේක. “මාව විශ්වාස කරන්නා මැරුණත් ජීවත් වන්නේය.” මාර්තා ජේසුස් වහන්සේව විශ්වාස කළාය. උන්වහන්සේ, දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව ඇය දැන සිටියාය. නමුත් උන්වහන්සේ ලාසරුස්ට කෙසේ උදව් කරන්නේද?
7


ලාසරුස් මියගිය නිසා සියල්ලෝ දුක් වූවෝය. ඔහුගේ සහෝදරිය, මරියා හඬමින් සිටියාය. ඇයව සනසන්නට උත්සාහ කළ ඇගේ මිතුරෝද හැඬුවෝය. ජේසුස් වහන්සේ ද හැඬු සේක.
8


ජේසුස් වහන්සේ මිනිසුන් සමඟ සොහොන් ගෙය ළඟට ගිය සේක. විශාල ගලක් දොරකඩ හරහා දමා තිබුණි.
9
“ගල ඉවත් කරන්නයැ” යි ජේසුස් වහන්සේ අණ කළ සේක. “ස්වාමීනි,” මාර්තා පිළිතුරු දුන්නාය. “මේ වන විට ඔහු මිය ගොස් දින හතරක් ගත වී ඇති නිසා දුර්ගන්ධයක් තිබෙනු ඇත”.
10
ජේසුස් වහන්සේගේ අණ පරිදි මිනිසුන් ගල ඉවත් කළෝය. ඉන්පසු ජේසුස් වහන්සේ තම ස්වර්ගීය පියාණන් වහන්සේට යාච්ඤා කළ සේක. ජේසුස් වහන්සේ, උන්වහන්සේව දෙවියන් වහන්සේ එවූ බව මිනිසුන් දැන ගන්නා පිණිස මහත් ආශ්චර්යයක් කිරීමට සූදානම්ව සිටිසේක.
11
“ලාසරුස්! එළියට එන්න” ජේසුස් වහන්සේ මහ හඬින් කීසේක. මිනිසුන් පුදුමයෙන් ගුහාව දෙස බලා සිටින්නට ඇත. ජේසුස් වහන්සේට මැරුණු කෙනෙකු නැවත ජීවත් කළ හැකි වේවිද?
12
එසේය! ලාසරුස් ගුහාවෙන් එළියට පැමිණියේය. මුළු ශරීරයම සොහොන් ඇඳුම් වලින් ඔතා තිබුණි. ඔහු ජීවත්ව සිටියේය!
13
“වෙළුම් පටි වලින් ඔහු මුදන්න” ජේසුස් වහන්සේ කීසේක. “ඔහුට යන්න දෙන්න”. මොනතරම් ප්‍රීතියක්ද! කඳුළු, සිනහවක් බවට පෙරළුණි. ජේසුස් වහන්සේ උන්වහන්සේගේ පොරොන්දුව ඉටු කළ සේක. ලාසරුස් නැවතත් ජීවත් වූයේය. මියගිය මිනිසෙකුට ජීවිතය ලබා
දිය හැක්කේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාට පමණි.
14

මෙම ප්‍රාතිහාර්යය දුටු බොහෝ අය ජේසුස් වහන්සේව විශ්වාස කළෝය. නමුත් තවත් සමහරු උන් වහන්සේ ගැන උන් වහන්සේගේ සතුරන් වූ දේවමාළිගාවේ නායකයින්ට වාර්තා කළෝය. ඔවුන් ඊර්ෂ්‍යාවෙන් ජේසුස් වහන්සේව මරන්නට කුමන්ත්‍රණය කළෝය. මෙය දැනගත් ජේසුස් වහන්සේ ස්වල්ප කාලයකට ඒ ප්‍රදේශයෙන් දුරස්ව සිටිසේක.





ජේසුස් වහන්සේ සහ ලාසරුස්

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. යොහාන් 11

**"ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ"**
**ගීතාවලිය** 119:130



# අවසානය

52 60



**මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.**

**දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැඟිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.**

**මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.**

**ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජිවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ** අලුත් **ජිවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.**

**දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)**